# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2294/71 – 2022 අගෝස්තු 27 වැනි සෙනසුරාදා – 2022.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක: IR/COM/02/2019/278.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.01.12 දිනැති හා අංක 2262/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.01.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් මතුගම, මද්දේගොඩ පාර, අංක 19 හි පිහිටි ලංකා වතු සේවා සංගමය (ඒ. එස්. කුමාරගේ මයා වෙනුවෙන්) සහ කොළඹ 10, ඩීන්ස් පාර, අංක 400 හි පිහිටි හොරණ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී, ඉංගිරිය පිහිටි හල්වතුර වත්ත අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
**කම්කරු කොමසාරිස් ජනරාල්.**

2022 අගෝස්තු මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කාර්මික අධිකරණයේ දී ය.**

*යොමු අංකය:* IR/COM/02/2019/278.
නඩු අංකය: A/03/2022

*පළමු පාර්ශවය*

1. ලංකා වතු සේවා සංගමය,
(ඒ. එස්. කුමාරගේ මයා වෙනුවෙන්)
අංක 19,
මද්දේගොඩ පාර,
මතුගම.

*සහ*


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*දෙවන පාර්ශවය*

1. හොරණ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
   අංක 400, ඩීන්ස් පාර,
   කොළඹ 10.

2. වතු අධිකාරි
   හල්වතුර වත්ත,
   ඉංගිරිය.

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා (පා.ම.) මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශවයන් අතර පවත්නා එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සරත් චන්ද්‍රසිරි විතාන වන මා පත්කොට ඇත. එසේම කම්කරු කොමසාරිස් ජෙනරාල් නීතීඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින් අංක IR/COM/02/2019/278 හා 2022.01.07 දිනැති නියෝගයෙන් මා පත්කර ඇති බව දන්වා ඇත.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

"ඉංගිරිය හල්වතුර වත්තේ සේවය කළ ඒ. එස්. කුමාරගේ මහතා විශ්‍රාමයාමෙන් පසුව නැවත සේවය කර ඇති 2014.06.01 සිට 2017.08.31 දක්වා වන කාලපරිච්ඡේදය සඳහා ද, විශ්‍රාම ගන්වන අවස්ථාව වන විට ගෙවන ලද මාසික වැටුප, මාසික වැටුප ගෙවල් කුලී දීමනාව සහ වෛද්‍යාධාර මුදල් හිමිවිය යුතුද? හිමිවිය යුතු නම් ඒ කවර ආකාරයෙන් ද? යන්න පිළිබඳව වේ.'' බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලයි.

*පළමු පාර්ශවය*

ලංකා වතු සේවා සංගමය,
(ඒ. එස්. කුමාරගේ මයා වෙනුවෙන්)
අංක 19,
මද්දේගොඩ පාර,
මතුගම.

*සහ*

*දෙවන පාර්ශවය*

1. හොරණ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
   අංක 400, ඩීන්ස් පාර,
   කොළඹ 10.

2. වතු අධිකාරි
   හල්වතුර වත්ත,
   ඉංගිරිය.

**මෙම බේරුම්කරණ විභාගය පැවැත්වූ ආකාරය -**

මෙම කාර්මික ආරාවුල IR/COM/02/2019/278 දරන බේරුම්කරණ අංකය යටතේ බේරුම්කරණය කිරීම පිණිස පහත සඳහන් දිනයන් යටතේ විභාගය සඳහා කැඳවීම් කර බේරුම්කරණ විභාගය පවත්වා ඇත. ඒ අනුව මෙම ආරාවුල,

2022.03.07
2022.03.16
2022.03.28
2022.04.04
2022.04.19

2022.05.04
2022.05.24 (මෙදින පමණක් අවලංගු වී ඇත)
2022.06.07

යන දිනයන්හි කැඳවා විමර්ශනයට භාජනය කරන ලදී. මේ අවස්ථා සඳහා ඉල්ලුම්කරු ඒ. එස්. කුමාරගේ සමග ලංකා වතු සේවා සංගමයේ නියෝජිත ලෙස ඩී. එස්. ජයසිංහ මහතා ද හොරණ ප්ලාන්ටේෂන් පීඑල්සී සමාගම වෙනුවෙන් සාමාන්‍ය අධිකාරී ආයතන පී. එස්. සමරකෝන් මහතා ද පෙනී සිටින ලදී. එසේම මෙම ආරවුල අවසන් බේරුම්කරණ තීරණයට අනුව 2022.06.07 වන දින මෙම ඉල්ලුම්කාර පාර්ශවය සමග වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් එම ආයතනයේ නියෝජිත ලිදමුලගේ මනෝජ් සුසන්ත සිල්වා කාර්යාලයීය නියෝජිත මහතා වශයෙන් ඉදිරිපත් කොට ඇත. ඔහුගේ හැඳුනුම්පත් අංකය 791580935V. පැමිණිලිකාර පාර්ශවය වෙනුවෙන් ඒ. එස්. කුමාරගේ මහතා සමග ලංකා වතු සේවා සංගමයේ නියෝජිත දිස්ත්‍රික් ලේකම් ඩී. එස්. ජයසිංහ මහතා පැමිණ සිටී. මෙහිදී අවසාන අධිකරණ විමර්ශන වාරයේදී එනම් 2022.05.04 වන දින පැවැත්වූ විභාගයේදී දූනුම් දුන් පරිදි,

''මේ අතර පැමිණිලි පාර්ශවය මෙම බේරුම්කරණයට ඉදිරිපත් කර ඇති කාල රාමුව තුළ විධිමත් ලෙස ගෙවීම් කිරීමට තිබෙන හිඟ ගණනයකර ඉදිරිපත් කර ඇති වාර්තාව නිරීක්ෂණයට ලක් කළෙමි. ඒ අනුව පැමිණිලිකරු 2014 ජුනි මස සිට 2016 දෙසැම්බර් කාලයට අදාළව ගෙවීමට එකඟ වූ බැවින් ඉතිරි කාලය වූ 2017 ජනවාරි සිට 2017 අගෝස්තු දක්වා වූ කාලයට අදාළ මුදල වන රුපියල් 167,898.00 ක මුදල ඉල්ලුම්කරු ඉල්ලුම්කර සිටිය ද ඒ පිළිබඳව දෙපාර්ශවයේ කරුණු විමසිල්ලට ලක් කළෙමි. වගඋත්තරකාර පාර්ශවය තමා මුලින් එකඟ වූ රුපියල් 365,010.00 ක මූල්‍ය ප්‍රදානයට අමතරව ගෙවීමට හැකියාවක් නොමැති බව දන්වා සිටින අතර පැමිණිලිකරු තමාට හිමි මුළු මුදලම ඉල්ලා සිටින බැවින් ද වසර 42 ක පමණ පූර්ණ සේවා කාලයක් සිය වැවිලි සමාගමට ලබාදී ඇති බැවින් ද එම ඉල්ලීමේ යුක්ති යුක්තය නිරීක්ෂණය වන බැවින් ද එකී මුදල ගෙවීමට සුදුසු බව නිරීක්ෂණය කෙරිණි. එහෙත් මෙම ප්‍රදානයේදී වැවිලි සමාගම නියෝජනය කරමින් ඉදිරිපත් කරනු ලැබූ මූලික කරුණු ද සළකා බලා එම වැවිලි සමාගමේ ධනාත්මක සුභ ප්‍රතිචාරය අගය කිරීමට ලක්කොට එකඟ වූ මූල්‍ය ප්‍රදානයට අමතරව එකතු කිරීමට යෝජිත මුදල වූ රුපියල් 167,898.00 ක මුදලින් 50% ක් අදාළ ඉල්ලුම්කරුට ගෙවීමට තීරණය කරමි. ඒ අනුව මෙම බේරුම්කරණයේ මුළු මුදල ලෙස රුපියල් 448,959.00 ක මුදල ප්‍රදානය කිරීමට සුදුසු බව තීරණය කරමි. එම මුදල බේරුම්කරණ ප්‍රදානය ඉදිරිපත් කර දින සිට සති 2 ක් ඇතුළත කම්කරු කොමසාරිස් බටහිර පළාත 2 වෙත ලබාදීමට අදාළ වැවිලි සමාගමට නියෝග කළෙමි. දෙපාර්ශවීය එකඟතාවය මත මෙම තීන්දුව ප්‍රකාශයට පත් කළෙමි.

මෙකී තීන්දුව කිසිදු ආකාරයකින් පූර්වාදර්ශයක් නොකර ගැනීමට අදාළ ලංකා වතු සේවක සංගමයට දන්වා සිටිමි. ඒ අනුව මෙම බේරුම්කරණයේ මුළු මුදල වන රුපියල් 448,959.00 ක මුදල ප්‍රදානය කිරීමට තීරණය කර එය කම්කරු කොමසාරිස් වෙත භාරදීමට අදාළ සමාගමට ලබාදුන් නියෝගය ප්‍රකාරව දෙපාර්ශවයේ එකඟතාවය මත ලබාදුන් තීන්දුවට එකඟවෙමින් හොරණ වැවිලි සමාගම මගින් කොමර්ෂල් බැංකුවේ විදේශීය ශාඛාවේ අංක 756539 හා 07.06.2022 චෙක්පත මගින් රුපියල් 448,959.00 ක් වටිනා චෙක්පත මගින් කම්කරු කොමසාරිස් ජෙනරාල්ගේ ගිණුමට බැර කිරීමට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව මෙම මුදල කම්කරු කොමසාරිස් වෙත තැන්පත්කොට අදාළ ඉල්ලුම්කරු වෙත ලබාදීමට නියම කරමි.

මෙම නියමය පරිදි මෙම බේරුම්කරණ කාර්මික ආරවුල සමථයකට පත්කරන අතර පූර්ව ප්‍රධානකරන තීන්දුවේදී ප්‍රකාශයට පත් කළ මෙකී තීන්දුව කිසිදු ආකාරයකින් පූර්වාදර්ශයක් ලෙස අදාළ නොකර ගැනීමට ලංකා වතු සේවක සංගමය ද එකඟ විය. මෙම දෙපාර්ශවයේම යහපත් ප්‍රතිචාර මත සමථයට පත්වූ මෙම බේරුම්කරණය සඳහා සජීවී ලෙස සහභාගිවෙමින් සහයෝගය ලබා දුන් හොරණ ප්ලාන්ටේෂන් පීඑල්සී ආයතනයේ සාමාන්‍ය අධිකාරී පී. එස්. සමරකෝන් මහතාටත්, ඉල්ලුම්කරු වෙනුවෙන් ලංකා වතු සේවා සංගමයේ නියෝජිත දිස්ත්‍රික් ලේකම් ටී. එස්. ජයසිංහ මහතාත් මෙම අධිකරණය වෙත ලබාදුන් සහයෝගය සුහදශීලී බව හා යහපත් චේතනාව සම්බන්ධව ප්‍රසාදය පළ කරමි. ඒ පිළිබඳව අදාළ ආයතන වෙත දන්වා යැවීමට කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයාට දැන්වීමට තීරණය කරමි. එසේම පැමිණිල්ල ඉදිරිපත් කර ලබාදුන් නියෝගය පිළිගැනීම සම්බන්ධයෙන් හා එම පැමිණිල්ල යුක්ති යුක්ත කිරීමට පැමිණිලිකාර ඒ. එස්. කුමාරගේ මහතාගෙන් ලද සහයෝගය ද අගය කොට සළකමි. මේ අනුව මෙම බේරුම්කරණය යුක්ති යුක්තව දෙපාර්ශවයේ යහපත් එකඟතාවයෙන් යුතුව අවසන් කරමි.

සරත් චන්ද්‍රසිරි විතාන,
බේරුම්කරු.

මේ අනුව බේරුම්කරණ ආරවුලේ ප්‍රදානයෙන් සමථයට පත්වීම අනුව පැමිණිලිකරු වන ඒ. එස්. කුමාරගේ මහතාට ගෙවිය යුතු රුපියල් 448,959.00 ක මුදල කොමර්ෂල් බැංකුවේ විදේශීය ශාඛාවේ අංක 756539 හා 762022 දරන චෙක්පත මගින් කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයා වෙනුවෙන් අංක N/25 0259764 දරන මුදල් ගෙවීමේ කුවිතාන්සිය මගින් කම්කරු දෙපාර්තමේන්තුවේ තැන්පත් කරන ලදී. අදාළ චෙක්පතේ සහ ලදුපතේ ඡායා පිටපත් මේ සමඟ අමුණා ඇත.

EOG 08 – 0274

මගේ අංකය: IR/COM/01/2019/26.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.03.10 දිනැති හා අංක 2166/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.02.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මීගොඩ, ගොඩගම දකුණ, අංක 38/3 හි පිහිටි ජී. සී. උදය කුමාර මයා සහ මල්වාන, වල්ගම, බියගම අපනයන සැකසුම් කළාපය, බ්ලොක් " A ", ලොට් 15 පිහිටි ලුමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය: IR/COM/01/2019/26.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

*නඩු අංකය:* A /08/2020

ජී. සී. උදය කුමාර,
අංක 38/3,
ගොඩගම දකුණ,
මීගොඩ.

*පළමු පාර්ශවය*

එදිරිව

ලුමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලොට් 15, බ්ලොක් " A ",
බියගම අපනයන සැකසුම් කලාපය,
වල්ගම, මල්වාන.

*දෙවන පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරවුල

**පෙනී සිටීම**

*පළමු පාර්ශවය වෙනුවෙන්* නීතිඥ වසන්ත ගුණසේකර මහතා,
නීතිඥ බොධිනී වික්‍රමසිංහ මිය

*දෙවන පාර්ශවය වෙනුවෙන්* නීතිඥ ශ්‍යාමලී ද සිල්වා මිය,
නීති නිලධාරි එම්. එස්. සී. ටී. පෙරේරා මහතා
නීතිඥ නිශිකා ෆොන්සේකා මිය,
නීතිඥ තරුෂි ජයරත්න මිය.

ප්‍රදානය

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39(1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින්

සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මවෙත යොමුකර ඇත. ආරවුල පිළිබඳ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ.

''ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් ආයතනයේ සේවය කළ ජී. සී. උදය කුමාර මහතාට පත්වීම් ලිපිය ප්‍රකාරව 2011 අප්‍රේල් මාසයේ සිට 2017 නොවැම්බර් මාසය දක්වා වාහන හා රියැදුරු දීමනාව ලබානොදීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී තිබේනම් ඔහුට හිමිවිය යුතු සහනයන් කුමක්ද? යන්න පිළිබඳ වේ.''

පළමු පාර්ශවය විසින් සිය පළමු ප්‍රකාශය ගොමු කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය විසින් සිය ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණි. මෙම නඩුව විභාග කිරීම සඳහා කැඳවූ පළමු දිනයේදී දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කර තිබූ පළමු ප්‍රකාශයට පිළිතුරු ගොනු කිරීම සඳහා පළමුවන පාර්ශවය විසින් දිනයක් ඉල්ලා සිටී. ඒ අනුව දිනයක් ලබාදී ඊළඟ දිනයේ දී නඩුව විභාගයට ගන්නා බැවින් ඊට සූදනම්ව පැමිණෙන ලෙස දන්වන ලදී.

ඉල්ලුම්කාර පක්ෂයේ දෙවන ප්‍රකාශය ගොනු කිරීමෙන් අනතුරුව නඩුව කැඳවූ 2022.04.05 දින ඉල්ලුම්කරු විසින් සාක්ෂියක් ලබා දෙන ලදී. ඔහු වගඋත්තරකාර ආයතනයේ සේවයට 2011.03.29 වන දින බැඳුණු බවත් තාක්ෂණික අධ්‍යක්ෂ තනතුර දරූ බවත්, සේවය ස්ථීර කර තිබූ බවත් කර්මාන්ත ශාලාවේ නව ගොඩනැගිල්ලේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සවිකිරීම සඳහා ඒවාට අවශ්‍ය සහාය සැපයුම් නිර්මාණය කිරීම ඒවා නිසි ස්ථානවල ස්ථානගත කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම තමාට පවරන ලද රාජකාරී බවත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේය.

නඩත්තු අංශයේ යන්ත්‍රසූත්‍ර සඳහා ගනු ලබන අමතර කොටස් සඳහා ගෙවීම් සිදු වූ බව සහතික කර වාණිජ අංශයට යැවීම ඉල්ලුම්කරුගේ රාජකාරියේ කොටසක් වූ බවත්, 2011.03.24 දින ඇතිකරගත් සේව්‍ය සේවක ගිවිසුම 2018.05.24 වන දින උල්ලංඝණය කර ඇති බැවින් කම්කරු විනිශ්චයාධිකරණයට මේ සම්බන්ධව පැමිණිල්ලක් කළ බවත්, නැවත සේවය ලබාදෙන ලෙස නැතිනම් සාධාරණ වන්දියක් ලබාදෙන ලෙස එම පැමිණිල්ලෙන් ඉල්ලා සිටි බවත් ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් තවදුරටත් කියා සිටී.

වගඋත්තරකාර පක්ෂය විසින් මීළඟ නඩු දිනයේ දී හරස් ප්‍රශ්න විමසීමක් සිදු නොකළ අතර මේ ආරාවුල සමථ කරගැනීම දෙවන පාර්ශවය සූදනම්ව කැමැත්ත ප්‍රකාශ කර සිටින බවත් සාධාරණ වන්දි මුදලක් ගෙවීමට වගඋත්තර පාර්ශවය එකඟ වන බැවින් පළමු පාර්ශවය මෙම සමථ යෝජනාව එකඟතාවය පළකරන බව හා ඒ අනුව කටයුතු කිරීමට සූදනම් බවත් ය.

## ප්‍රදානය

මෙම බේරුම්කරණ නඩුවට අදළව 2022.06.01 දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දී වගඋත්තරකාර ආයතනය විසින් පූර්ණ සමථයක් යෝජනා කරමින් කියා සිටින්නේ,

- ඉල්ලුම්කරුට රුපියල් මිලියන තුනක් (රු. 3,000,000.00) ගෙවීමටත්
- එම රුපියල් මිලියන තුන (රු. 3,000,000.00) මාස 10 කින් ගෙවා නිම කිරීමටත්
- මසකට රුපියල් ලක්ෂ තුන (රු. 300,000.00) බැගින් ගෙවීමටත්
- මෙම ගෙවීම 2022 දෙසැම්බර් 25 වන දින ආරම්භ කිරීමටත්
- 2022 දෙසැම්බර් සිට සෑම මසකම 25 වන දිනට හෝ ඉන් පෙර ගෙවීමටත්
- එම මුදල මැද කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කිරීමටත් එකඟ වන බවයි.

සේවක පාර්ශවය වෙනුවෙන් කියා සිටින්නේ සේවායෝජක පක්ෂය විසින් කරනු ලබන යෝජනාවට එකඟතාවය පළකරන බවයි. මෙම සමථ යෝජනාවට දෙපාර්ශවයම එකඟතාවය පළකර සිටින බැවින් තවදුරටත් දෙපාර්ශවය අතර ආරවුලක් නොපවතින නිසා මෙම සමථ නියෝගය ප්‍රදානය ලෙස ප්‍රකාශ කර සිටිමි.

මෙය සාධාරණ හා යුක්තිසහගත ප්‍රදානයක් බව සහතික කරමි.

නීතිඥ ඩී. ජී. කේ. කරුණාරත්න
බේරුම්කරු.

2022 ජූනි මස 30 වැනි දින.

EOG 08 - 0275

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.